කායවාවච්ඡේද අධ්‍යයනාංශය,
වෛද්‍ය විද්‍යා පීඨය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ,ගංගොඩවිල, නුගේගොඩ.

**දු.අං - 011-2802164 / වි.තැ - anatomyusjp@gmail.com**

ගරු ස්වාමීන් වහන්ස/පූජකතුමනි/මහත්මයාණෙනි/මහත්මියෙනි/මෙනවියනි,

**<u>වෛද්‍ය, සෞඛ්‍ය අධ්‍යාපනය සහ වෛද්‍ය පර්යේෂණ සඳහා මෘත දේහ පරිත්‍යාග කිරීම.</u>**

ඉහත කරුණ පිළිබඳව ඔබගේ ලිපියට/ඉල්ලීමට ස්තුතියි. මරණින් පසු ඔබේ සිරුර වෛද්‍ය අධ්‍යාපනය සඳහ ප්‍රදානය කිරීමට ඔබ තුළ ඇති පරමාර්ථය බෙහෙවින් අගය කරන අතර මෘත ශරීරයක් පරිත්‍යාග කිරීමේ සැලකිල්ලට ගත යුතු කරුණු ඔබ වෙත ඉදිරිපත් කරමි.මරණින් පසු මෘත ශරීරයේ අයිතිය ඥාතීන්/භාරකරුවන සතුවේ. එබැවින් ඔබ ඒ සඳහා ඥාතීන්ට පහත සඳහන් උපදෙස් දී තිබීම ඉතා වැදගත්ය.

1. මෘත ශරීරයක් පරිත්‍යාග කළ හැක්කේ ස්වභාවික මරණයක් නම් පමණි.

2. මරණය සිදු වූ වහාම ඒ බව ඥාතීන්/භාරකරුවන් විසින් අධ්‍යයනාංශ ප්‍රධාන/කාර්මික නිලධාරි වෙත ජාතික හැඳුනුම්පතද සමග සතියේ දිනවලදී (සඳුදා සිට සිකුරාදා දක්වා) පෙ.ව 8.00 සිට ප.ව.2.00 දක්වා වේලාවන් තුළදී ඉහත ලිපිනයට හෝ පහත සඳහන් දුරකථන අංකවලට දැනුම් දීමෙන් අවශ්‍ය කටයුතු සලසා ගත හැකිය.එහිදී භාරකරුගේ නම,ලිපිනය,ජාතික හැඳුනුම්පත් අංකය හා මෘත දේහය බහාලූ පෙට්ටිය පිළිබඳ අවසන් නිගමනය දැනුම් දිය යුතුය.

(අ) 011-2802164,011-2758671 (අංශ ප්‍රධාන,කායවාවච්ඡේද අධ්‍යයනාංශ)
(ආ) 011-2758694(කර්යාලය,කායවාවච්ඡේද අධ්‍යයනාංශ)

3. මෘත ශරීර බාරගනු ලබන්නේ සතියේ දිනවලදී (සඳුදා සිට සිකුරාදා දක්වා) පෙ.ව 8.00 සිට ප.ව.2.00 දක්වා වේලාවන් තුළදී පමණි. සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දිනවලදී බාරගනු නොලැබේ.

4. කායවාවච්ඡේද අධ්‍යයනාංශය සඳහා මෘත ශරීර බාරගනු ලබන ආකාර දෙකකි.

(අ) **මරණය සිදුවී පැය 12ක්** ඇතුළත මෘත ශරීරය අධ්‍යයනාංශයෙන් **විමසීමකින් පසුව පරිත්‍යාග කිරීම.**

මෙම ක්‍රමයේදී මෘත ශරීරය එම්බාම් කිරීම අවශ්‍ය නැත.මරණය සිදුවී පැය 12ක් ඇතුළත මෘත ශරීරය වෛද්‍ය විද්‍යා පීඨයේ කායවාවච්ඡේද අධ්‍යයනාංශයට ළඟා විය යුතුය. මෙය සිදුකළ හැක්කේ සතියේ කර්යාල විවෘතව පවතින දිනවල(සඳුදා සිට සිකුරාදා දක්වා) පෙ.ව 8.00 සිට ප.ව.2.00 දක්වා වේලාවන් තුළ දී පමණි.

(ආ) **මරණය සිදුවී දින තුනක් ඇතුළත මෘත ශරීරය පරිත්‍යාග කිරීම.**

මෙහිදී එම්බාම් කළයුත්තේ පාදයේ කලවා පෙදෙසේ ඉහළ කොටසේ ඉදිරියෙන් පිහිටි ඌර්ව ධමනිය තුළින් ස්වාරක්ෂක තරලය (ෆෝමලීන්) ශරීරයට ඇතුළු කිරීමෙනි.එම්බාම් කිරීමේදී තනුක නොකරන ලද ෆෝමලීන් ද්‍රාවණයකින් ලීටර 05 ක් මෘත ශරීරයට ඇතුළු කළ යුතුය.මෘත ශරීරය පරිත්‍යාග කරන අවස්ථාවේදී එම්බාම් කිරීම නිසි ලෙස සිදුවී නොතිබුනහොත් එය භාරගැනීමට අපහසු වන අතර ඉන් ප්‍රයෝජනයක් ගත නොහැකි බව කරුණාවෙන් දන්වමි.

- එමෙන්ම ශරීරයේ අනෙකුත් කිසිදු කොටසකට හානි නොවී තිබිය යුතුය.

5. අක්ෂිදාන සංගමයට (011-2692051, 011-2698040, 0112-698041) මියගිය තැනැත්තාගේ ඇස් දන් දීම ගැන විරුද්ධත්වයක් නොමැත. (ශරීරයේ වෙනත් කොටසක් කැපීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය.)

7. පහත සඳහන් ආකාරයේ මෘත ශරීර පරිත්‍යාග කළ නොහැකිය.

1. අවුරුදු 18 ට අඩු
2. මිය යන අවස්ථාවේදී සමේ වණ, කුෂ්ඨ, දද, ඒඩ්ස්, සෙංගමාලය වැනි බෝවෙන රෝග වැළදී තිබීම.
3. නිසියාකාරව එම්බාම් නොකර වෛද්‍ය විද්‍යා පීඨයට භාරදෙන අවස්ථාවේදී 'නරක්'වී තිබෙන මෘත ශරීර
4. හදිසි අනතුරුවලට භාජනය වීම
5. පිළිකා වැළදී තිබීම
6. පශ්චාත් මරණ පරීක්ෂණ වලට භාජනය කරන ලද මෘත ශරීර

8. මෘත දේහයක් ප්‍රදානය කිරීමට පැමිණෙන පුද්ගලයන් විසින් සැලකිලිමත් විය යුතු අනෙක් කරුණු මෙසේය.

(අ) වෛද්‍ය විද්‍යා පීඨයට ප්‍රදානය කළ මෘත දේහයක් යළිත් භාරදීමක්/ දැක ගැනීමට කිසිවෙකුටත් (උදා: ඥාතීන් හෝ භාරකරුවන්ට) අවසර නොලැබේ.

(ආ) වෛද්‍ය විද්‍යා පීඨය විසින් ප්‍රවාහන පහසුකම් හෝ වියදම් සපයනු නොලැබේ.

(ඇ) වෛද්‍ය විද්‍යා පීඨය තුළ ආගමික හෝ වෙනයම් උත්සවයක් පැවැත්වීමට අවසර නොලැබේ.

(ඈ) මෘත දේහ ප්‍රදානය සඳහා වෛද්‍ය විද්‍යා පීඨයට කිසිදු ගෙවීමක් කළ යුතු නැත.

(ඉ) දේහය ප්‍රදානය කළපසු පෙට්ටිය, ඇඳුම් සහ පැළඳ සිටි ආභරණ වෙතොත් ඒවාද නැවත භාරදෙනු ලැබේ.

(ඊ) අධ්‍යයන කටයුතු අවසන්වීමෙන් පසු ඉතිරි වූ ශරීර කොටස් රජයේ සුසාන භූමියක භූමදානය කරනු ලබ අතර එම කොටස් පවුලේ සාමාජිකයින්ට ආගමික කටයුතු වලට හෝ භූමදාන කටයුතු සඳහා ලබාදීමට අපහ වීම පිළිබඳව අපි කණගාටු වන්නෙමු.

(උ) වෛද්‍ය පීඨයේ පීඨාධිපති ඇතුළු කාර්ය මණ්ඩලයේ මඟ පෙන්වීම යටතේ වෛද්‍ය පීඨයේ බෞද්ධ සංගම විසින් මෘත ශරීර පරිත්‍යාග කළ දායකයන් උදෙසා පිං අනුමෝදන් කිරීම පිණිස වාර්ෂික සර්වරාත්‍රික පිරි සජ්ඣායනයක් පවත්වනු ලැබේ. පිරිත් සජ්ඣායනය සහ පසුදා උදෑසන පවත්වනු ලබන දානමය පිංක සඳහා සියලුම පවුලේ සාමාජිකයින්ට වෛද්‍ය පීඨ භූමියට පැමිණ සහභාගී වීමට ආරාධනා ක සිටින්නෙමු. මෘත ශරීර භාරදුන් දායකයන්හට පිං පැමිණවීම සඳහා අනෙකුත් ආගම් වලට අදාල ආගමික වැඩ සටහන් ක්‍රියාත්මකවේ.

අවශ්‍ය වැඩිදුර උපදෙස් සඳහා කායව්‍යවච්ඡේද අධ්‍යයනාංශයෙන් විමසන්න. මෘත ශරීර පරිත්‍යාග කිරීම සඳහා උපදෙස් ඇති පිටු අංක1-2 ඔබ හෝ ඔබගේ ඥාතියෙකු ළඟ සුරැකිව තබන්න.මෙම විස්තර පත්‍රිකාවේ විශ්ව විද්‍යාලයීය පිටපත අපහට ලැබෙන්නට සලස්වන්න.රජයේ නිවාඩු දිනයන්,සෙනසුරාදා,ඉරිදා දිනයන් වලදීත්,ඉඩකඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවන් වලදීත් මෘත ශරීර භාර නොගන්නා බව කරුණාවෙන් සලකන්

මෘත ශරීරය පරිත්‍යාග කිරීම සම්බන්ධයෙන් ඔබ දක්වන සැලකිල්ල ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉතා අගය කොට සලකයි.

..........................................
අංශ ප්‍රධාන/කායව්‍යවච්ඡේද අධ්‍යයනාංශය ,
වෛද්‍ය විද්‍යා පීඨය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල,
නුගේගොඩ.

..........................................
පීඨාධිපතිතුමා,
වෛද්‍ය විද්‍යාපීඨය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල,
නුගේගොඩ.

# ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ, වෛද්‍ය විද්‍යාපීඨයේ,

# කායව්‍යවච්ඡේද අධ්‍යයනාංශය වෙත මෘතදේහය පරිත්‍යාග කිරීම.

දායකයාගේ හැඳින්වීම

01. සම්පූර්ණ නම.......................................................................................................
02. උපන් දිනය.........................................................................................................
03. ලිපිනය...............................................................................................................
04. දුරකථන අංකය....................................................................................................
05. ජාතික හැඳුනුම්පත් අංකය.....................................................................................
06. පහත දැක්වෙන කුමනහෝ රෝගයකින් ඔබ පසුවන්නේද?

| | | | |
|---|---|---|---|
| 1. ඒඩ්ස් | ඔව්/නැත | 3. පිළිකා | ඔව්/නැත |
| 2. සෙංගමාලය | ඔව්/නැත | 4. වෙනත් | ඔව්/ නැත |

07. බරපතල සැත්කම් වලට භාජනය වී ඇත්ද?

........................................................................................................................................

08.විකලාංග සැත්කම් වලදී ඇණ, පතුරු හෝ අනෙකුත් උපකරණ ශරීරයට ඇතුළු කර තිබේද?

........................................................................................................................................

09. අවයව පරිත්‍යාග කර හෝ බද්ධ කිරීමක් කර තිබේද?.................................................

මීළඟ භාරකරුගේ හැඳින්වීම

01. සම්පූර්ණ නම ......................................................................................................
02. උපන් දිනය .........................................................................................................
03. ලිපිනය ...............................................................................................................
04. දුරකථන අංකය ....................................................................................................
05. ජාතික හැඳුනුම්පත් අංකය.....................................................................................

........................................................................................................................ වන මම

පිටු 2කින් සමන්විත වන අදාළ උපදෙස් මාලාව කියවා තේරුම් ගතිමි. මා මියයාමෙන් පසු මාගේ මෘතශරීරය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ, වෛද්‍ය විද්‍යා පීඨයේ, කායව්‍යවච්ඡේද අධ්‍යයනාංශයට වෛද්‍ය, සෞඛ්‍ය අධ්‍යාපනය සහ වෛද්‍ය පර්යේෂණ කටයුතු සඳහා පරිත්‍යාග කිරීමට කැමැත්ත මෙයින් ප්‍රකාශකර සිටිමි.

මෙයට විශ්වාසී,